# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1416/22 – 2005 ඔක්තෝබර් 27 වැනි බ්‍රහස්පතින්දා – 2005.10.27

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී.21/78.

#### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 23(2) වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2005 ඔක්තෝබර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2005 අංක 3 දරන ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර 2005.10.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 2004 අගෝස්තු මස 05 වැනි දින අංක 1352/21 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2004 අංක 1 දරන නියමාවලිය මගින් සංශෝධිත 1990 ජනවාරි මස 05 වැනි දින අංක 591/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1990 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල නියමාවලියේ 16 වන ඡේදයේ (5) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ නියමාවලිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

"(5) අධ්‍යාපන පීඨයේ පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය :—

(1) ද්විතීය සහ තෘතීය අධ්‍යාපනය ;

(2) පූර්ව ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය ; සහ

(3) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය."

11—223

1A - G 006237 - 800 (2005/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.